# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

පී. කේ. ආර්. කුමාරසිරි,
අංක 80, දේවාල පාර, පමුණුව,
මහරගම.

**අභියාචක**

**අභියාචනා අංකය : 1960/2020**

**-එදිරිව-**

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
කොළොන්නාව නිමාව,
වැල්ලම්පිටිය.

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී** : 1. විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න - සභාපති
2. විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී.
පොදු අධිකාරිය වෙනුවෙන් නීති නිලධාරි මහේෂිකා කුමාරි මිය (තොරතුරු නිලධාරි) පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2020.06.23, 2020.07.06, 2020.08.24, 2021.04.22
පොදු අධිකාරිය - 2020.07.01, 2020.09.11

**විභාග කළ දිනය** : 2020.07.21, 2020.09.15, 2020.12.01, 2021.01.26, 2021.04.27, 2022.03.03

**තීරණය කළ දිනය** : 2022.03.03

**තීරණය**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2019.06.27 සහ 2019.08.16 දිනැතිව තොරතුරු ඉල්ලීම දෙකක් මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

අභියාචක විසින් 2019.06.27 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*"a) පී. කේ. ආර්. කුමාරසිරි වන මා හට අසාධාරණ ලෙස දඬුවම් කිරීමට එරෙහිව ගරු සභාපතිතුමා, ගරු කළමනාකාර අධ්‍යක්ෂතුමා වෙත ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කරන ලද 2019.03.15 දිනැති මාගේ අත්සනින් යුතු එම අභියාචනය එතුමන්ලාගේ අවධානයට යොමු වී තිබෙනවාද*

*b) ඉහත සඳහන් අභියාචනය සම්බන්ධයෙන් මේ වන විට කුමන හෝ පියවරක් ගෙන තිබෙනවාද ? එසේ නම් එහි ප්‍රගතිය කුමක්ද*

*c) ඉහත සඳහන් අභියාචනය සමාලෝචනය කිරීමට/විමර්ශනය කිරීමට/පරීක්ෂා කර බලා වාර්තා කිරීමට කුමන හෝ තැනැත්තෙකු වෙත ඉදිරිපත් කර තිබෙනවාද? ඒ කවදාද? එම තැනැත්තාගේ නම කුමක්ද?*

*d) ඉහත සඳහන් අභියාචනය සමාලෝචනය කිරීමට/විමර්ශනය කිරීමට/පරීක්ෂා කර බලා වාර්තා කිරීමට කිසියම් තැනැත්තෙකු වෙත ඉදිරිපත් කර ඇත්නම්, ඔහු/ඇයගෙන් ඊට අදාල වාර්තාවක් පාලනාධිකාරිය වෙත ලැබී තිබෙනවාද? ඒ කවදාද? එම වාර්තාවේ සහතික කරන ලද පිටපතක්"*

අභියාචක විසින් 2019.08.16 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*"“පී.කේ.රෙජිනෝල්ඩ් කුමාරසිරි මහතාට එරෙහිව පැවති විධිමත් විනය පරීක්ෂණයේ නිගමනයන්ට හා එය පාදක කොටගෙන ලබා දී ඇති දඬුවම් අභියෝගයකට ලක් කරමින් ඉදිරපත් කර ඇති අභියාචනය සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ විමර්ශනයට අදාල වාර්තාව" යන මැයෙන් විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති පී.ඒ. සරත් පෙරේරා මහතා විසින් CPSTL සමාගමේ (සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්) සභාපතිවරයා වෙත පිටපතක් ද සහිතව එම සමාගමේ කළමනාකර අධ්‍යක්ෂ වෙත තැපැලෙන් යොමු කර ඇති 2019 ජුනි 04 දිනැති වාර්තාවේ සහතික කරන ලද පිටපතක්"*

තොරතුරු නිලධාරි පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019.08.31 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත.

නම්කළ නිලධාරි 2019.09.16 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ *"අභියාචක විසින් ඉල්ලා ඇති වාර්තාව මානව සම්පත් කාර්යංශයට හෝ ආයතනික කටයුතු කාර්යංශයට ලැබී නොතිබීම හා/හෝ එම තොරතුරු සන්තකයේ නොපැවතීම"* යනුවෙනි.

මෙම තීරණයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2019.10.30 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

අභියාචක විසින් 2020.06.23 සහ 2020.07.06 දිනැති ලිඛිත ප්‍රකාශ කොමිෂන් සභාවට යොමු කර ඇත.

පොදු අධිකාරියේ නම්කල නිලධාරී විසින් 2020.07.01 දිනැති ලිපිය මගින් පහත සඳහන් තොරතුරු කොමිෂන් සභාවට දන්වා ඇත.

*"සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ සේවකයන්ගේ විනය සම්බන්ධව සියළුම කටයුතු නීති කාර්යංශය හරහා සිදු කරනු ලබන අතර විනය නියෝග සමාලෝචනය කිරීමේ කටයුතු ද ප්‍රධාන නීති නිලධාරී මගින් සිදු කරනු ලබයි. නමුත් පී.කේ.ආර් කුමාරසිරි මහතාගේ විනය නියෝගය පිළිබඳව සමාලෝචනයක් ප්‍රධාන නීති නිලධාරී හරහා සිදු වී නොමැති බැවින් ඉල්ලුම්කරු*

*ඉල්ලා ඇති ආකාරයේ ලේඛනයක් නීති කාර්යාංශ සතුව නොපවතින බව දන්වා ඇත. එසේම මානව සම්පත් කාර්යාංශය හා ආයතනික කටයුතු කාර්යාංශයෙන් කල විමසීමේදී එබඳු ලේඛනයක් එම කාර්යාංශ සන්තකයේ ද නොමැති බව දන්වා ඇති බව"* යි.

අභියාචක විසින් 2020.08.24 දිනැතිව කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කරමින් ලිපියක් එවා ඇති අතර එහි පහත කරුණු දක්වා ඇත.

*"මවිසින් ඉල්ලා සිටින ලද තොරතුරු CPSTL සමාගම වෙත ලැබීමෙන් පසුව ඒ සඳහා ගාස්තු වශයෙන් රුපියල් තිස් දහසක මුදලක් (රු30000.00) හෝ ඊට ආසන්න මුදලක්, විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති පි ඒ සරත් පෙරේරා මහතා වෙත චෙක්පතක් මගින් එතුමාගේ පුද්ගලික ගිණුමකට බැර කර ඇති බවත්, එම චෙක්පත නිකුත් කර ඇත්තේ ගරු සභාපතිතුමා යටතේ පවත්නා ලේකම් හා ආයතනික කටයුතු අංශය මගින් බවත් මා හට දැනගන්නට ලැබී තිබේ. ඒ සම්බන්ධයෙන් ආයතනික කටයුතු අංශයේ ප්‍රධානි සමන්ති ගමගේ මහත්මියගෙන් (0112534744, 0718349518) අසා දැන ගැනීමට හැකි බවත්, එම ගාස්තුව ලබාගත් සරත් පෙරේරා මහතාගෙන්ද විමසා දන ගැනීමට හැකි බවත මාගේ වැටහීමයි.*

*නම්කළ නිලධාරියා කියා සිටින ආකාරයට ඉහත තොරතුරු CPSTL සමාගම වෙත නොලැබුණේ නම් විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති පි ඒ සරත් පෙරේරා මහතා වෙත චෙක්පතක් මගින් රු30000.00 ක මුදලක් ලබා දීමට හේතුව කුමක්ද යන ප්‍රශ්නය ගරු ඔබතුමන්ලා විසින් විමසා බලනු ඇතැයි අපේක්ෂා කරමි."*

කෙසේවෙතත්, කොමිෂන් සභාවේ 2020.07.21 දින නියෝගය අනුව පොදු අධිකාරිය 2019.06.27 සහ 2019.08.16 දිනැතිව තොරතුරු ඉල්ලීම් දෙක සම්බන්ධයෙන් 2020.09.11 දිනැති ලිඛිත දේශනයන් ඉදිරිපත් කර ඇත.

පොදු අධිකාරිය විසින් 2020.09.11 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයට ප්‍රතිඋත්තර වශයෙන් අභියාචක විසින් 2021.04.22 දිනැති ලිඛිත ප්‍රකාශය කොමිෂන් සභාවට යොමු කර ඇත.

**සලකා බැලීම**

පොදු අධිකාරියේ නීති නිලධාරි විසින් අද දින අභියාචක වෙත යවන ලද සත්‍ය පිටපතක ලේඛනයක් ඉදිරිපත් කරමින් එහි අන්තර්ගත වන්නේ අභියාචක විසින් ඉල්ලා සිටි ඔහුට එරෙහිව පැවති විනය පරික්ෂණයේ තීරණයට එරෙහිව සිදු කළ අභියාචනා පරික්ෂණයේ තීරණය බවත් එකී තීරණය එම අභියාචනය විභාග කළ විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති පී.ඒ සරත් පෙරේරා මහතා විසින් එය තමාගේ වාර්තාව බවට සහතික කරමින් තොරතුරු නිලධාරි වෙත එවන ලද වාර්තාවක් බවට ප්‍රකාශ කර සිටී. අංක 01 සිට 15 දක්වා පිටු එහි අන්තර්ගතව ඇති බවට නියෝජ්‍ය පොලිස්පති විසින් සහතික කර ඇති අතර එය අභියාචක සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන වාර්තාවේ පිටපතක් බවට සහතික කර ඇත.

මේ අනුව තමා විසින් ආයාචනය කරන ලද තොරතුරු ලැබී ඇති බව අභියාචක විසින් පිළිගනී. ඒ අනුව මෙම අභියාචනය අවසන් කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

අද දින පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත කී පරික්ෂණ කොමිෂන් සභාවේ පිටපත අභියාචකට ඉදිරිපත් කරන්න.

මෙම නියෝගය අභියාචක වෙත, තොරතුරු නිළධාරි වෙත සහ පොදු අධිකාරිය වෙත දන්වා යැවීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.